## ශ්‍රී ලංකා වරාය අධිකාරිය
## දැන්වීමයි

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෛද්‍ය කොට්ඨශය විසින් සෞඛ්‍යාරක්ෂක පහසුකම් තම කාර්ය මණ්ඩලය වෙත ලබාදීම සඳහා ආදේශන (ලෝකම්) පදනම යටතේ වෛද්‍ය නිලධාරීන් ලියාපදිංචි කිරීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

<u>**වෛද්‍ය නිලධාරීන් ආදේශන පදනම යටතේ ලියාපදිංචි කිරීම**</u>

**(අ) යෝග්‍යතාවය**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් MBBS උපාධිය හෝ ඒ හා සමාන උපාධියක් සමඟ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වෛද්‍ය නිලධාරියෙකු ලෙස ලියාපදිංචි වී තිබීම.

**සමඟ**

**පළපුරුද්ද**

අවම වසර තුන (03) ක පශ්චාත් සීමාවාසික පළපුරුද්ද.

ප්‍රජා/කාර්මික සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සුදුසුකම් හා පළපුරුද්ද සහිත වෛද්‍ය නිලධාරීන් හට ප්‍රමුඛස්ථානයක් දක්වනු ලැබේ.

**කාර්යය විෂයපථය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලයට හා වරාය භාවිතා කරනු ලබන අයවළුන් සඳහා සෞඛ්‍ය සත්කාරක කටයුතු ලබා දිය යුතු අතර, එහිදී හදිසි අනතුරු අවස්ථා කළමනාකරණය, කාර්ය මණ්ඩලය හා සේවකයින් බඳවා ගැනීමේදී වෛද්‍ය සුපරීක්ෂණ කටයුතු සිදු කිරීම,වැඩ මුරයට අදාල වෛද්‍ය සත්කාරක හා පරිපාලන රාජකාරී ආවරණ කටයුතු ද අයත් වේ.

**රාජකාරී වේලාවන්**

සේවා අවශ්‍යතා මත සේවා මුර ක්‍රමය ලබා දෙනු ලැබේ.

**(ආ)** වැටුප

පැයකට රු. 2,000/=

ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර සඳහන් ජීවදත්ත අයඳුම්පත අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමඟ **ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන), මානව සම්පත් හා පරිපාලන කොට්ඨාශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13.** යන ලිපිනයට ලැබෙන සේ 2026-09- 30 වන දිනට පෙර <u>ලියාපදිංචි තැපෑලෙන්</u> එවිය යුතුයි. **අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

<u>**අදාල සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**</u>

මෙම දැන්වීම www.slpa.lk යන වෙබ් අඩවියේද පළ කරනු ඇත.

**අවශ්‍ය වැඩිදුර විස්තර සඳහා අමතන්න**

වෛද්‍ය සඳුනි ලියනගේ (වැඩ බලන නියෝජ්‍ය ප්‍රධාන වෛද්‍ය නිලධාරි, වෛද්‍ය කොට්ඨශය)

දුරකථන අංක : 071-6655171, 0112-483462

**සභාපති**